(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 14.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2019 ජනවාරි 08 වැනි අඟහරුවාදා අ.භා. 1.00 ට**

## ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 සිට 5 දක්වා විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී 27 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— තේරීම් කාරක සභාව (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 114 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, පවත්නා සභා වාරයේ සේවය සඳහා තේරීම් කාරක සභාව, කථානායකවරයාගේ සභාපතිත්වයෙන් සහ දේශපාලන පක්ෂවල නායකයන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ද ඇතුළත්ව පාර්ලිමේන්තුව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දහහත් දෙනෙකුගෙන් (17) සමන්විත විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— තේරීම් කාරක සභාව (අංක 2),— අද දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව සහ 2018 නොවැම්බර් 23 වැනි දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද සාමාජික මන්ත්‍රීවරයන්ට අතිරේකව, පහත නම් සඳහන් සාමාජික මන්ත්‍රීවරයන් පස්දෙනා (05) පවත්නා සභා වාරය තුළදී මෙකී තේරීම් කාරක සභාවේ සේවය කළ යුතුය:—

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් දහතුන් දෙනෙකුගෙන් (13) සමන්විත විය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— රජයේ මුදල් පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දහතුන් දෙනෙකුගෙන් (13) සමන්විත විය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— තානාපති වරප්‍රසාද පනත යටතේ නියෝග,— 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වගන්තිය යටතේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජුනි 05 දිනැති අංක 2074/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.08.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

රසායනික අවි සම්මුතිය පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වගන්තිය යටතේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 සැප්තැම්බර් 11 දිනැති අංක 2088/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.10.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*4.

යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අය කරගැනීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා,— උද්දීපන පනත යටතේ නියමය,— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දීපන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ තුර්කි ජනරජය අතර උද්දීපන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 13 දිනැති අංක 2079/77 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

***** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**